සැ. යු.- 2014.03.28 දින පළ වූ අංක 1,856 දරන ගැසට් පත්‍රයේ I:III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,857 - 2014 අප්‍රේල් මස 04 වැනි සිකුරාදා - 2014.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 504 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 505 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි* දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්,* 2014 අප්‍රේල් මස 25 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2014 අප්‍රේල් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. ඩී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 මැයි මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,<br>රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 මාර්තු මස 18 වැනි දින,<br>බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මහනුවර | පූජාපිටිය | මහනුවර දිස්ත්‍රික්කයේ පල්ලෙගම්පහ උතුර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා හාරිස්පත්තුව විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

04-164

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 මැයි මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,<br>රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 මාර්තු මස 18 වැනි දින,<br>බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මහනුවර | අකුරණ | හාරිස්පත්තුව කොට්ඨාසයේ රඹුකේ ඇළ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාසයේ පෙතියාගොඩ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

04-163

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය

### ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම - 2014/2015

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්‍ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම්ලත් අපේක්‍ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය නව පරිශ්‍රය දියගම හෝමාගම,ස්ථාපනය කරන තෙක් මොරටුව විශ්ව විද්‍යාලයීය පරිශ්‍රය තුළ පැවැත්වෙනු ඇත.

1. *සාමාන්‍ය :*

ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂයය ක්‍ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ.

(*අ*) *නාවුක අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (Set 1)*

(i) නාවුක ඉංජිනේරු තාක්‍ෂණය
(ii) නෞකා චලන අධ්‍යයන හා තාක්‍ෂණය

(*ආ*) *අනිකුත් අධ්‍යයන ක්‍ෂේත්‍රයන් (Set 2)*

(i) රසායන ඉංජිනේරු තාක්‍ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්‍ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්‍ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්‍ෂණය
(v) යාන්ත්‍රික ඉංජිනේරු තාක්‍ෂණය
(vi) පොලිමර් තාක්‍ෂණය
(vii) පේෂකර්ම හා ඇඟලුම් තාක්‍ෂණය

2. *යෝග්‍යතාවය :*

2.1 *වයස :*

(*අ*) 2013.12.31 වැනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 ට වැඩි නොවිය යුතු ය.

(*ආ*) නෞකා චලන අධ්‍යයන තාක්‍ෂණය හා නාවුක ඉංජිනේරු තාක්‍ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්‍ෂකයන් තෝරා ගැනීමේ දී 2013.12.31 වැනි දිනට වයස අවුරුදු 20ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ දී විශේෂ වෛද්‍ය පරීක්‍ෂණයකට හා සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිට ඉන් සමත්විය යුතු වේ.

(*ඇ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින්, 2011, 2012 හෝ 2013 වසරේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් සමත්විය යුතු ය :

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

3. *තෝරා ගැනීමේ පදනම/ක්‍රියාපරිපාටිය :*

3.1 *පාඨමාලාවට ඇතුළත් කර ගැනීම :*

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්‍ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්‍ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්‍ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ. පො. ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත (Z ලකුණු මත). සිසුන් තෝරාගනු ලැබේ. 40% ක් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60%ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරාගැනීම සිදුවේ.

3.2 *අධ්‍යයන ක්‍ෂේත්‍රය :*

යෝග්‍යතා පරීක්‍ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්‍ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්‍ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

4. *අයදුම් කිරීමේ පිළිවෙල :*

4.1 *අයදුම්පත් පෝරම :*

(i) *ගැසට් නිවේදනයේ* දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

ආදර්ශ අයදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක :
http ://www.mrt.ac.lk/itum

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ඇතුළත් වීම - 2014/2015" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

"නියෝජ්‍ය ලේඛකාධිකාරි, තාක්‍ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව".

(iii) තම ලිපිනය ලියන ලද රු. 40 ක් වටිනා මුද්දර අලවන ලද 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයදුම්පත සමග එවිය යුතු ය.

(iv) අයදුම්පත සමග සහතිකවල මුල්පිටපත් හෝ පිටපත් එවීම අවශ්‍ය නොවේ. එහෙත් අයදුම්පතේ සඳහන් තොරතුරු අදාළ පරිදි සහතික කර තිබිය යුතු ය. (අයදුම්පතේ 03, 04 සහ 05 යන ඡේද බලන්න).

4.2 *අධ්‍යයන ක්‍ෂේත්‍රයන් තෝරා ගැනීම :*

(i) මෙම පාඨමාලාව අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

(ii) නාවික අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනිකුත් අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්‍ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්‍ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයදුම්කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතු ය.

(iii) නාවික අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩයේ දී, එනම් නාවුක ඉංජිනේරු තාක්‍ෂණය සහ නෞකා චලන අධ්‍යයන

තාක්ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාවය සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතු ය.

(iv) අනිකුත් ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛතාවය 1, 2, 3, 4, 5, 6, 7 සඳහන් කළ යුතු අතර වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද, ඊළඟ ක්ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්ෂේත්‍රය 07 ලෙසද සඳහන් කළ යුතු ය.

5. (i) *ඉල්ලුම් පත්‍ර ගාස්තු :*

ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා රු. 300 (තුන්සීයක්) හෝ ක්ෂේත්‍රයන් දෙකටම රු. 500 (පන්සීයක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් "මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 0000308280" දරන ගිණුමට බැර වන සේ ගෙවිය යුතු ය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2014.05.02 වැනි දින වේ.

6. *යෝග්‍යතා පරීක්ෂණය :*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලසු කළ සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7. *පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම :*

(i) යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය :

(i) අ. පො. ස. (උ. පෙළ) සහතිකය ;

(ii) අ. පො. ස. (උ. පෙළ) z ලකුණු සඳහන් සහතිකය ;

(iii) පාසැල් හැරයාමේ සහතිකය ;

(iv) උප්පැන්න සහතිකය ;

(v) නමේ වෙනසක් ලියකියවිලිවල හා සහතිකපත්වල ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්.

8. *ඉතා වැදගත් :*

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළ දී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි. (විවෘත විශ්වවිද්‍යාලය හැර).

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

අධ්‍යක්ෂ,
තාක්ෂණික ආයතනය.

මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

| APPLICATION FOR ADMISSION TO THE NATIONAL DIPLOMA IN TECHNOLOGY COURSE<br>INSTITUTE OF TECHNOLOGY<br>UNIVERSITY OF MORATUWA<br>ACADEMIC YEAR 2014/2015 | *For office use only* | | | |
|---|---|---|---|---|
| | Application No. | | | |
| | District | | | |

Application for (Please ✓ )

1. Maritime Fields - SET 1 ☐
2. Other Fields - SET 2 ☐

[Applicants may apply for single set (Set 1 or Set 2) or both sets (Set 01 and Set 02)]

01. Personal Details : (Please use ***BLOCK CAPITALS***)

Name in Full :

(Leave one blank cage between names)

Name with Initials :

(Leave one blank cage between names)

| *Title* ▶ | Mr./Ms. | | Sex ▶ | Male/Female | |
|---|---|---|---|---|---|
| Age<br>As at 31st Dec. 2013 | (Years) | (Months) | Date of Birth | | |
| | | | Date | Month | Year |
| | | | | | |
| National ID Number | | | | | |

02. Contact Details :

Address (Residence):

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(Leave one blank cage between different segments of the address)

| | |
|---|---|
| Telephone | |
| Mobile | |
| E-mail (if available) | |

03. Results of G. C. E. (Advanced Level) Examination :

| *Subjects & Details of Examination* | *Grades & Details obtained at the* | | |
|---|---|---|---|
| | *1st Attempt* | *2nd Attempt* | *3rd Attempt* |
| Year | | | |
| Physics | | | |
| Chemistry | | | |
| Combined Mathematics | | | |
| Advanced Mathematics | | | |
| Index Number | | | |
| Z-Score | . | . | . |
| Results of the year to be considered for Selection (indicate whether 2011 or 2012 or 2013 | | | |

04. **MEDIUM**

| | |
|---|---|
| Medium in which you wish to sit the Aptitude Test | Sinhala/Tamil/English (Delete whatever is inapplicable) |

05. School(s) attended from Year 11 to Year 13

| *Year* | *Name & Address of School* | *District* | *Period of Attendance* | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | *From* | | | *To* | | |
| | | | *Year* | *M* | *D* | *Year* | *M* | *D* |
| 11 | | | | | | | | |
| 12 | | | | | | | | |
| 13<br>1st Attempt | | | | | | | | |
| 2nd Attempt | | | | | | | | |
| 3rd Attempt | | | | | | | | |

06.Certification of Results and Schools attended :

**It is compulsory to certify the results under No. 03 and details under No. 04 in the application by the School Principal for the School Candidates, and by a Justice of Peace for External Candidates.**

I certify that the particulars given above by the candidate in the cage No. 3 and No. 4 are true and accurate according to the Original Certificates.

Name of the Principal/Justice of the Peace :
Rev./Dr./Mr./Mrs. ...............................................................

...................... .....................
Signature Date

Official Seal

07. Field Preference :

SET 1 - Insert order of preference as 1 for First preference and 2 for Second preference. This should be completed only by the candidates who have applied for Maritime Studies.

SET 2 - Insert order of preference as 1, 2, 3, 4, 5, 6, 7. ‘1’ for the “Most Preferred”, ‘2’ for the next and so on. ‘7’ for the last preferred.

| *SET 1* | |
|---|---|
| *Maritime Fields* | *Order* |
| Marine Engineering Technology | |
| Nautical Studies and Technology | |

| State Priority, if applied for both SETS – ✓ | |
|---|---|
| SET 1 | |
| SET 2 | |

| *SET 2* | |
|---|---|
| *Other Fields* | *Order* |
| Chemical Engineering Technology | |
| Civil Engineering Technology | |
| Electrical Engineering Technology | |
| Electronic and Telecommunication Engineering Technology | |
| Mechanical Engineering Technology | |
| Polymer Technology | |
| Textile & Clothing Technology | |

| | | |
|---|---|---|
| Are you registered as a fulltime student in any other University under the UGC (other than Open University) or any other Higher Educational Institution under the Ministry of Education ? (Delete whatever is inapplicable) | Yes | No |

*APPLICANT'S DECLARATION :*

(1) I declare that I am not a fulltime registered student at any University (except Open University of Sri Lanka) or any Higher Educational Institution under the Ministry of Education.

(2) I certify that all the particulars given by me in this Application are true and accurate. I am aware that if the

particulars given by me in this Application are found to be false or inaccurate prior to my admission, I will be discontinued from the course.

(3) In the event of my being selected for admission after the Test, I shall abide by the Statutes, By-Laws, Regulations and the Rules of the Institute of Technology, University of Moratuwa, in so far as they are applicable to me.

(4) I have pasted the cash deposit/ cash transfer receipt obtained from Bank of Ceylon, drawn in favour of "Institute of Technology, University of Moratuwa - Account No. 0000308280 of Bank of Ceylon, Katubadde Branch".

(5) I also enclose a self addressed stamped envelope (Rs. 40 worth) in size 9" x 4".

(6) I am aware that if I am found to be registered in another University or any other Higher Educational Institution under the Ministry of Education at the time of sitting for the Aptitude Test for the National Diploma in Technology Course, I will not be selected for the Course.

———————,
Signature of Applicant.

Date :—————.

| Paste your Cash Deposit/Cash Transfer Original Slip here. |
|---|

04-46

---

**ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2014**

01. ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව, කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව තෝරාගත් අයදුම්කරුවන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි තනතුරේ III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

03. *වයස් සීමාව :*
ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

04. *සුදුසුකම් හා පළපුරුද්ද :*

(*a*) *අධ්‍යාපන සුදුසුකම්*

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.;

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා හෝ ගණිත අංශයේ සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් ව තිබීම.

(*b*) වෘත්තීය සුදුසුකම් :
4a හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය.

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් හෝ පරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව; *හෝ*

(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව; *හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව; *හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව; *හෝ*

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම; *හෝ*

(vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ලබා තිබීම.

(c) කායික සුදුසුකම් :
දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි මනා ශරීර සෞඛ්‍යය තත්ත්වයකින් යුක්ත වීම.

(*d*) *වෙනත් සුදුසුකම් :*

(i) පරිගණක දත්ත සැකසුම පිළිබඳව දැනුම සහිතව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ආයතනයකින් NVQ 3 මට්ටමේ පරිගණක පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.

(ii) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

05. *වැටුප් පරිමාණය*
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) යටතේ MN3 - 2006A
රු. 15,005 - 180 x 4 - 240 x 6 - 320 x 11 -360 x 20 රු. 27,885

III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 3 ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු අතර, පත්වීම ලැබ වසර 5 ක් ගත වීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

අංක 7/2007 පරිදි අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ මට්ටමේ භාෂ ප්‍රවීණතාව ලබාගත යුතු ය.

06. *සේවා කොන්දේසි* :

1. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
2. තෝරා ගන්නා අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත් වනු ඇත.
3. තෝරා ගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, දැනටමත් රජයේ සේවකයෙක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්වේ.
4. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග හා දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

07.

(i) *බඳවා ගැනීමේ ක්‍රමය* :
ලිඛිත විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත විභාගය පවත්වනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් වන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරිකෂණයට කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 ජූලි මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

(ii) *විභාග ක්‍රමය* :

(අ) විභාගය, සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයා විභගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(ඇ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) *විභාගයේ විෂයන්* :
විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. :-

1. බුද්ධි පරීක්ෂණය
2. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය

(iv) *ප්‍රතිඵල නිකුත් කිරීම* :

ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයයට ලකුණු 40% හෝ වැඩියෙන් ලැබූ අපේක්ෂකයින් මුලු ලකුණු කුසලතාව අනුව තෝරා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක අපේක්ෂක සංඛ්‍යාවක් ඇතුලත් නම් අකාරා දී පිළිවෙලට සැකසූ සම්මුඛ පරීක්ෂණ නාම ලේඛනය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශ ලේකම් වෙත ලබාදෙනු ඇත. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැබීමෙන් අනතුරුව ලිඛිත පරීක්ෂණයේ ලකුණු හා සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල මුලු එකතුව පදනම්කර ප්‍රමුඛතා අනුපිළිවෙලින් සකසන ලද ප්‍රතිඵල ලේඛනය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබාදෙනු ඇත.

08. *විෂය නිර්දේශය* :

1. බුද්ධි පරීක්ෂණය :
කාලය පැය 01 කි
මුළු ලකුණු 100 යි

පදගත, සංඛ්‍යාත්මක හා රූපකාර ආකාරයෙන් ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ තර්කානුකූලව සිතීමේ, විශ්ලේෂණය කිරීමේ හැකියාව හා කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

2. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය
කාලය පැය 03 කි
මුළු ලකුණු 100 යි

පහත දැක්වෙන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරනු ලැබේ. :-

(1) ප්‍රමාණ ගණන් ගැනීම,
(2) ප්‍රමාණ බිල්පත් (BOQ) සකස් කිරීම,
(3) ඇස්තමේන්තු පිළියෙල කිරීම,
(4) ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ සඳහා ප්‍රමාණයන් විශ්ලේෂණය කිරීම

ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ.

* ඉහත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන ජ්‍යාමිතික උපකරණ හා සෙසු උපාංග අයදුම්කරු විසින් විභාග ශාලාවට රැගෙන ආ යුතු ය.

09. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* :

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද් දී, විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

10. *විභාග ගාස්තු* :
විභාග ගාස්තුව රු. 600 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 ට බැරවෙන පරිදි ඕනෑ ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ තැපැල් කාර්යාලයකට ගෙවිය හැකි ය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට් පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසා වත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

11. *අයදුම් කළ යුතු ක්‍රමය* :

(අ) අයදුම්පත්‍ර A4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(i) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවැනි පිටුවට ද,

(ii) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු ය.

(iii) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් සැලකිලිමත් විය යුතු ය. සියලු ආකාරයෙන් අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2014 මැයි මස 02 වැනි දින හෝ ඊට කලින් පහත ලිපිනයට එවිය යුතු ය. :-

විභාග කොමසාරිස් ජනරාල්,<br>
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
පැලවත්ත, බත්තරමුල්ල.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී III වැනි ශ්‍රෙණියට බඳවා ගැනීම - 2014" යනුවෙන් සඳහන් කළ යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඇ) දැනටමත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 12.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

(ඈ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. අයදුම්කරන ලද විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ඔබගේ එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම ද සුදුසු වේ. එසේ විමසීමේ දී අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීම සඳහා ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද සූදානම් කොට තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

(ඉ) අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාග දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

(ඊ) කිසියම් අපේක්ෂකයෙකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය

13. මෙහි සඳහන් නොවන, යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී. එච්. එල්. විමලසිරි පෙරේරා,<br>
ලේකම්,<br>
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා<br>
පොදු පහසුකම් අමාත්‍යාංශය.

2014 අප්‍රේල් මස 04 වැනි දින,<br>
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

Open Competitive Examination for the Recruitment to Technical Officer Grade III of Sri Lanka Technical Service of the Ministry of Construction, Engineering Service, Housing and Common Amenities - 2014

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐

සිංහල - 2 ☐<br>
දෙමළ - 3<br>
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.<br>
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) *උදා* : PERERA, A. B. C.

1.2 සම්පූර්ණ නම :————.<br>
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.<br>
(සිංහලෙන්/දෙමළෙන්)

2.0

2.1 ස්ථිර ලිපිනය :————.<br>
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 තැපැල් නගරය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය ඃ
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

3.2 ජාතික හැඳුනුම්පත් අංකය ඃ

3.3 උපන් දිනය ඃ වර්ෂය මාසය දිනය

3.4 2014.05.02 දිනට වයස ඃ අවු ඃ මාස ඃ දින ඃ

4.0 අධ්‍යාපන සුදුසුකම් ඃ
4.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 2. | |
| 3. | | 4. | |
| 5. | | 6. | |
| 7. | | 8. | |
| 9. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 තාක්ෂණ සුදුසුකම් ඃ

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |

6.0 වෙනත් සුදුසුකම් ඃ

| ආයතනය | හදාරා ඇති පරිගණක පාඨමාලාව |
|---|---|
| | |

7.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

7.1 දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ලිපිනය :————.

7.2 දැනට දරන තනතුර :————.

7.3 සේවා කාලය :————.

7.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන බව :————.

8.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් නැත

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

10.0 අයදුම්කරුගේ සහතිකය ඃ

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ……………… මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී.......... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

12.0 අයදුම්කරු රජයේ සේවකයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

……………… මයා./මිය./මෙනවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/ තාවකාලික/ අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව. :————.

04-125

---

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2014

බලයලත් සැළසුම් ශිල්පියෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වේයර් ජනරාල්ගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

I වැනි කොටස - බණ්ඩාංක පත්‍ර පිළියෙල කිරීම
II වැනි කොටස - පිඹුරු වැඩ

2. විභාගයේ පළමුවැනි කොටස 2014 ජුලි මස 19 වැනි දින දී ද, දෙවැනි කොටස 2014 ඔක්තෝබර් මස 18 හා 19 යන දිනයන්හි දී ද පැවැත්වෙනු ඇත. පළමු වැනි කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට දෙවැනි කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන්ම එකවර සමත් වන අපේක්ෂකයින්, බලයලත් සැළසුම් ශිල්පීන් සඳහා වන සර්වේයර් ජනරාල්ගේ සහතිකය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේ දී, අපේක්ෂකයින්ට පහත සඳහන් දෑ කළ හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතු ය.

(*අ*) ක්ෂෙත්‍ර සටහනක් මගින් බණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් බණ්ඩාංක කිරීමට;

(*ආ*) කෝණමානය භාවිතයෙන් හා බණ්ඩාංක ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට හා ක්ෂෙත්‍රඵලය ගණනය කිරීමට.

4. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(*අ*) ජාතික අධ්‍යාපන සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙක (02) ක් සහිතව විෂයයන් හය (06)කින් සමත් වීම.

සහ

(*ආ*) රජයේ කාර්මික විද්‍යාලයක හෝ වෙනත් අර්ධ රාජ්‍ය ආයතනයක, අවුරුද්දකට නොඅඩුවූ කාල සීමාවක් සහිත, සැලසුම් ශිල්පය හා සම්බන්ධ පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

5. පහත දැක්වෙන ආදර්ශය අනුව පිළියෙල කර ගත් අයදුම්පත්‍ර රු. 400.00 ක් වටිනා මුදල් ඇණවුමක් හෝ දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවා ලබාගත් රිසිට් පතක් සමග "ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (විභාග), මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, දියතලාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මුදල් ඇණවුමේ ගෙවීම් ලබන්නා "ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) ලෙස ද, ගෙවන කාර්යාලය, "දියතලාව" ලෙසින් ද සඳහන් කළ යුතු ය. එසේම රිසිට් පතේ මුල් පිටපත හෝ මුදල් ඇණවුමේ මුල් පිටපත අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු ය. (කරුණාකර රිසිට් පත හෝ මුදල් ඇණවුම අයදුම් පත්‍රයේ අලවා නොඑවන්න.) කවරයෙහි වම්පස ඉහල කෙළවරේ "බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2014" යනුවෙන් සඳහන් කරන්න. මුද්දර මගින් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.

6. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

7. අයදුම්පත් 2014 මැයි මස 16 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.

8. බණ්ඩාංක පත්‍ර හා ඇඳීම් කඩදාසි විභාග ශාලාවේ දී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් විසින් ඇඳීම් උපකරණ ද, බණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු යනාදිය ද, අවශ්‍ය අනෙකුත් සියලු උපකරණ ද රැගෙන ආ යුතු ය. විභාග ශාලාධිපති ගේ අවසරය ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

9. (i) සෑම විභාග අපේක්ෂකයෙකුම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකිය.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත;
(*ආ*) වලංගු ගුවන් ගමන් බලපත්‍රයක්;
(*ඇ*) විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ

ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්.

(ii) ඉහත 9(i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

එන්. ගුණවර්ධන,
සර්වේයර් ජනරාල්.

2014 මාර්තු මස 20 වැනි දින
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506,
කොළඹ 05.

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2014

විභාග අංකය [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අ) (i) මුලකුරු සමග නම : (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :————.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :
සිංහලෙන් :————.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

(ආ) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

(ඇ) තනතුර :————.

(ඈ) රැකියා ස්ථානයේ ලිපිනය :————.

(ඉ) ස්ථිර ලිපිනය :————.
සිංහලෙන් :————.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

(ඊ) උපන් දිනය :————.

(උ) අධ්‍යාපන සුදුසුකම් (සහතික කරන ලද සත්‍ය පිටපත් අමුණා තිබිය යුතුය.) :————.

(ඌ) විභාගයට පෙනී සිටින මාධ්‍යය : සිංහල/දෙමළ/ඉංග්‍රීසි :————.

(එ) ගෙවන ලද ගාස්තු :————.

(ඒ) මුදල් ඇණවුම්/රිසිට්පත් අංකය :————.
නිකුත් කළ කාර්යාලය :————.
දිනය :————.

(ඔබ විසින් දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවන ලද්දේ නම් එම රිසිට් පත හෝ මුදල් ඇණවුමක් මඟින් එවන්නේ නම් එම මුදල් ඇණවුමේ මුල් පිටපත හෝ අමුණා එවිය යුතු ය.)

මවිසින් ඉහතින් දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි තොරතුරු බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

04-127

---

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව

**ආධුනිකයින් බඳවා ගැනීම - 2014 ජූලි**

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව ආධුනිකත්ව අභ්‍යාස ආයතනයෙහි පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :

1. *පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :*

| *පාඨමාලාවේ නම* | *ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)* | *කාලය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ) | - | අවු. 03 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය, සහ විද්‍යාව සමග විෂයයන් 6ක් සමත් වී තිබීම. |
| 02. විදුලි කාර්මික ශිල්පී (විශේෂ) | 4 වැනි මට්ටම | අවු. 03 | |
| 03. ඉදිකිරීම් සුපරීක්ෂක | 4 වැනි මට්ටම | අවු. 1 1/2 | |
| 04. ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී | 4 වැනි මට්ටම | අවු. 02 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත් වීම. |
| 05. යන්ත්‍ර කාර්මික ශිල්පී (විශේෂ) - Machinist Special) | 4 වැනි මට්ටම | අවු. 03 | |

| පාඨමාලාවේ නම | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | කාලය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| 06. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ පාඨමාලාව - (ICT) | 4 වැනි මට්ටම | අවු 01 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත්වීම සහ අංක 06, 07 සඳහා මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම. |
| 07. පරිගණක චිත්‍ර නිර්මාණ පාඨමාලාව | 4 වැනි මට්ටම | අවු. 01 1/2 | |
| 08. පෑස්සුම් ශිල්පී - Welder | 4 වැනි මට්ටම | අවු. 03 | අ. පො. ස. (සා. පෙළ) දක්වා හෝ ඊට ඉහළ සුදුසුකම් |
| 09. ජලනල කාර්මික ශිල්පී | 4 වැනි මට්ටම | අවු. 02 | |
| 10. දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | 4 වැනි මට්ටම | අවු. 02 | |

2. *වයස.*—2014.04.21 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

3. *පුහුණුව පිළිබඳ විස්තර* :

3.1 සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුළ දී ලබාදේ. පුහුණුවේ දෙවැනි භාගයේ දී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

දැව කාර්මික ශිල්පි හා පෑස්සුම් ශිල්පි වැනි කාර්මික ශිල්පීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩිවී ඇත. පෑස්සුම් ශිල්පී පාඨමාලාවේ දී නවීන පෑස්සුම් ශිල්පී ක්‍රම ද පුහුණු කරනු ලැබේ. (MMS/GAS/TIG/MIG/MAG/PLASMA)

4. *තෝරා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මගින්

5. *අයදුම්පත් එවිය යුතු ආකාරය* :

5.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව, 11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගත් හෝ www. atimoratuwa.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් 2014 අප්‍රේල් මස 21 වැනි දිනට පෙර අධ්‍යක්‍ෂ/විදුහල්පති, ආධුනිකත්ව අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ආධුනිකයන් බඳවා ගැනීම 2014 ජූලි" යන්න සඳහන් කළ යුතු ය.

5.2 මහජන බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 3131001536569984ට බැර කරන ලෙස සඳහන් කරමින් ඕනෑම බැංකු ශාඛාවකට රු. 500 ක් ගෙවා ලබා ගත් ලදුපතෙහි ඡායා පිටපතක් සහ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම් පත සමඟ එවිය යුතු ය.

5.3 මුදල් ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතු ය.

5.5 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරන අයට මේ සඳහා අයදුම්කළ නොහැක.

6. තැපෑලේ දී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් ආධුනිකත්ව අභ්‍යාස ආයතනය වග කියනු නොලැබේ. කිසිදු හේතුවක් නිසා හෝ ගෙවන ලද මුදල් ආපසු නොගෙවන අතර ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව

ආධුනිකයින් බඳවා ගැනීම - 2014 ජුලි

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

ආදර්ශ අයදුම් පත්‍රය (11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ)

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :—————. මයා/මිය/මෙනෙවිය
2. මුලකුරු සමග නම :—————.
3. ලිපිනය :—————.
4. පදිංචිය :
   (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.
   (ii) දිස්ත්‍රික්කය :—————.
5. දුරකථන අංකය : නිවස :—————. ජංගම :—————.
6. මුදල් ගෙවන ලද ලදු පතෙහි අංකය සහ බැංකු ශාඛාවේ නම :—————.
7. උපන් දිනය :—————.
8. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
9. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් X ලකුණින් සළකුණු කරන්න.)

| | | | | | |
|---|---|---|---|---|---|
| අ. පො. ස. (උ.පෙළ) | | අ. පො. ස. (සා. පෙළ) | | 8 වන ශ්‍රේණිය | |

අ.පො.ස (සා/පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

| හදාරා ඇති පරිගණක පාඨමාලාවන් |
|---|
| |
| |
| |
| |

10. ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.
    1. —————.
    2. —————.
    3. —————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

04-74

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | *රු. ශ.* |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2014**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් | 2014.04.04 | සිකුරාදා | 2014.03.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.11 | සිකුරාදා | 2014.03.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.17 | බ්‍රහස්පතින්දා | 2014.04.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.25 | සිකුරාදා | 2014.04.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2014.05.02 | සිකුරාදා | 2014.04.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2014.05.09 | සිකුරාදා | 2014.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.16 | සිකුරාදා | 2014.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.23 | සිකුරාදා | 2014.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.30 | සිකුරාදා | 2014.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2014.06.06 | සිකුරාදා | 2014.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.13 | සිකුරාදා | 2014.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.20 | සිකුරාදා | 2014.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.27 | සිකුරාදා | 2014.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.